**භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය - 2017**

**----------------------------------------------------**

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2018 සැප්තැම්බර් 27 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2017 දෙසැම්බර් 31 දිනට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් රු.229,934,178 ක්වූ කාර්යාංශයට අනුබද්ධිත ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 66 ක හිමිකමක් කාර්යාංශය ලබාගෙන තිබුණද කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

කාර්යාංශය හා ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගම අතර පැවති පහත සඳහන් සම්බන්ධතා හා ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(අ) කාර්යාංශයේ සභාපතිවරයා නිල බලයෙන් ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ සභාපතිවරයා බව.

(ආ) අදාල සමාගම විසින් කාර්යාංශය වෙනුවෙන් වැයකරන ලද වියදම්.

(ඇ) කාර්යාංශය සඳහා සේවකයින් සමාගම හරහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබීම.

(ඈ) කාර්යාංශයේ රාජකාරී සඳහා සමාගමේ සේවකයින් යෙදවීම හා සමාගමේ රාජකාරී කාර්යාංශයේ සේවකයන් මගින් ඉටුකර ගැනීම.

### 2.2.3 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව නොනිමි වැඩ යටතේ ඉකුත් වර්ෂයේදී දක්වා තිබුණු රු.2,102,992 ක අගය සමාලෝචිත වර්ෂයේදී නොවෙනස්ව පැවතුණි. එහෙත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ නොනිමි වැඩ සඳහා රු.597,479 ක මුදල් ගලා ඒමක් සටහන් වී තිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් නොවන ගැළපීම් යටතේ මෙහෙයුම් ලාභයට ගැළපිය යුතු විලම්බිත ආදායම් රු.3,286,893 ක් මූලා ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

(iii) ආපදා අරමුදලට බැර කර තිබූ රු.20,562,846ක්, එම අරමුදලට ලද පොලිය රු.292,528ක් හා අරමුදලින් ගෙවීම් රු.1,337,867ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙන වෙනම ගළපනු වෙනුවට රු.19,517,507 ක් වූ එම ශුද්ධ ශේෂය මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

-----------------------------------------------

කාර්යාංශය වෙත 2016 වර්ෂයේදී ලැබී තිබුණු රු.16,968,108 ක් වූ විදේශ ප්‍රදාන වලින් රු.3,276,493 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණද, විදේශීය ප්‍රදාන ගිණුම් තැබීමට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

-----------------------------------------------

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද රු.456,925,092 ක් වූ දේපල පිරියත හා උපකරණ මිලදී ගත් මාසයේ අවසන් දිනට පැවති අගය මත ක්ෂය කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 22 ඡේදය ප්‍රකාරව කාර්යාංශයට විරුද්ධව බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලැබූ ගොඩනැගිල්ලේ හිමිකරු විසින් පවරා ඇති නඩුවක් හේතුවෙන් ගෙවීමට සිදුවෙතැයි නීති නිලධාරී විසින් ඇස්තමේන්තු කර තිබූ රු.1,136,348 ක මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට බාහිර පාර්ශව විසින් කාර්යාංශයට විරුද්ධව නඩු 18 ක් පවරා තිබුණ අතර කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 04 ක් පවරා තිබුණු අතර ප්‍රමිතයේ 100 ඡේදය ප්‍රකාරව මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් අනාවරණය කර නොතිබුණි.

**2.2.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

--------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 ඉක්මවූ රු.3,941,549 ක ණය ශේෂ පැවතුණ අතර බොල්ණය ප්‍රතිපාදනය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

**2.2.5 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගම විසින් කාර්යාංශය වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2017 දක්වා වැයකරන ලද කාර්ය මණ්ඩල වියදම් කාර්යාල අලුත්වැඩියා හා ව්‍යාපෘති වියදම් පිළිවෙලින් රු.14,832,994 ක්, රු.777,059 ක් හා රු. 1,618,283 කාර්යංශයේ ගිණුම්වල දක්වා නොතිබුණි.

(ආ) කාර්යාංශය සතුව පැවති රු.199,962,533 ක් වටිනා ඉඩම් 2015 වර්ෂයේදී වෙනත් රාජ්‍ය ආයතනවලට පවරා තිබුණද, ඒවා තවදුරටත් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්වල ඇතුළත්කර තිබුණි.

(ඇ) පල්ලෙකැලේ සුනාමි සන්නිවේදන මධ්‍යස්ථානය නඩත්තුව සඳහා විදේශ විශ්ව විද්‍යාලයකින් ලැබී තිබුණු නමුත් ආපසු නොගෙවිය යුතු මුදලේ අතිරික්තය වූ රු.9,137,179 ක් ජංගම වගකීමක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂ අවසාන දිනට රසායනාගාරයේ ඉතිරිව තිබූ වර්ග 23 කට අයත් රසායන ද්‍රව්‍ය බෝතල් 157 ආගණනය කර අවසාන තොග ලෙස දක්වා නොතිබුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | තොග (පොත් හා සිතියම්) | 668,527 | භෞතික පැවැත්ම සහතික නොවීම |
| (ආ) | ජර්නල් වව්චර් 395 ක් | 222,226,636 | ජර්නල් වව්චර් සඳහා අනුමැතිය |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2002 වර්ෂයේදී භාණ්ඩ හා සේවා බදු අවලංගු කර තිබුණද වැඩිපුර ගෙවා තිබූ රු.973,143 ක් අදාළ වර්ෂවලදී නිරවුල් නොකිරීම හේතුවෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 26(1) හා 44(ආ) වගන්ති | රජය වෙනුවෙන් කාර්යාංශය විසින් අයකර ගන්නා රාජ්‍යභාග මුදල් භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත් 2014, 2015, 2016 හා 2017 වර්ෂවල ලැබුණු පිළිවෙලින් රු.428,601,622 ක් රු.438,810,229 ක්, රු.568,348,602 ක් හා රු.94,780,968 ක් භාණ්ඩාගාරය වෙත විගණිත දින දක්වාම ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ<br>(i) 9(2)(ඊ)වගන්තිය | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ රු.4,531,246,600 ක් වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට රඳවාගැනීමේ ලාභයෙන් අඩුවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. |

| | |
|---|---|
| (ii) 11 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට රු.275,406,692 ක් භාණ්ඩාගාර බිල්පත්වල හා රු.2,332,800,273 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණද ඊට අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (iii) 13(8) වගන්තිය | 2016 වර්ෂය සඳහා වූ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට පිළිතුරු ලබාදී නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 6(2)(අ) ඡේදය | පනත ප්‍රකාරව මාස ½ ක වැටුප මත පාරිතෝෂික ගණනය කළ කළයුතු වුවද 2015 සිට මාසයක වැටුප මත ගණනය කිරීම හේතුවෙන් නිලධාරීන් 16 කට රු.6,317,415 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර රු.59,387,751 ක් වැඩියෙන් වෙන්කර තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු 23 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371(5) | සමාලෝචිත වර්ෂය අවසානයේ නොපියවූ රු.4,457,890 ක උපඅග්‍රිම ශේෂ පියවා ගැනීමට කටයුතු නොකර වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 වගන්තිය | කාර්යාංශයේ සියලුම අංශ සඳහා කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක ඊඑස්ටී/ටීපීඕආර්ටී/05/35/5 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වර්ෂය තුළ වාහන 06 ක සිදුකළ අභ්‍යන්තර අලුත්වැඩියා සඳහා ගරාජයේ මිල ගණන් පිළිගැනීමට පෙර හා අලුත්වැඩියාවෙන් පසු සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරු වාර්තා ලබාගෙන නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවුනු ගනුදෙනු

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබානොගෙන රු.964,950 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගයෙන් ඉවත් කර තිබුණු අතර ඉවත් කිරීම සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,752,278,508 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.1,564,027,187 ක ලාභයක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,188,251,321 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. කාර්යාංශයේ මෙහෙයුම් වියදම් රු.18,803,342 කින් පරිපාලන වියදම් රු.30,732,195 කින් හා ආදායම් බදු රු.48,398,761 කින් වැඩිවී තිබුණද, රාජ්‍ය භාග ආදායම රු.3,047,443,154 කින්, බලපත්‍ර ගාස්තු රු.50,851,306 කින්, මූල්‍ය ආදායම් රු.165,046,696 කින් හා වෙනත් ආදායම් රු.20,516.016 කින් වැඩි වීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව ලාභයේ වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ක්ෂය වීම් නැවත ගැලපීමෙන් පසු කාර්යාංශයේ දායකත්වය 2013 වර්ෂයේ රු.910,344,782 ක් වූ අතර 2017 වර්ෂයේදී රු.5,182,846,496 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

---------------

#### 4.1.1 සැලසුම් කිරීම

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශය 2015 – 2017 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂයේ දී යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්මේ දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යාංශයේ අංශ 11 හා ප්‍රාදේශීය කාර්යාල 16 හි කාර්යභාරය ඇතුළත් වන පරිදි හා එක් එක් අංශයට භෞතික හා මූල්‍ය කාර්යසාධන ඉලක්ක හා වගකීම් ලබාදෙමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

----------------------------------------

අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ කාර්යයන් අතරින් භූ විද්‍යා සිතියම් සකස් කිරීම, ඛනිජ සම්පත් හඳුනාගැනීම සහ ඒවා තක්සේරු කිරීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක තිබූ අතර පතල් කැනීමේ වාණිජමය ස්වශක්තිතාව පිළිබඳව ඇගයීම ද, ඛනිජ සකස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම හා වෙළඳාම ද, වාණිජමය පදනමක් මත ඛනිජ නිෂ්කර්ෂණය කිරීම, වටිනාකම් එකතු කිරීම සහ නිෂ්පාදනය අපනයනය සඳහා උපයෝගී කරගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම යන කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(ආ) පනත බලගැන්වීමේ බලතල කාර්යාංශය වෙත පැවරී තිබුණද බලාත්මක කිරීමේ ඒකකයක් පිහිටුවා නොතිබීම හේතුවෙන් පනත උල්ලංඝනය කිරීම් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) කාර්යාංශයේ එක් එක් අංශවල වාර්ෂික, අර්ධ වාර්ෂික හා කාර්තුමය කාර්යසාධන වාර්තා පිළියෙල කර හෝ එක් එක් කාර්ය සඳහා අවශ්‍ය ලිපිගොණු පවත්වා හෝ නොතිබීම හේතුවෙන් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ දක්වා තිබූ ප්‍රගතිය ද පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවක අර්ථසාධක අරමුදල සඳහා සේව්‍ය හා සේවක දායකත්වය 3:2 අනුපාතයට විය යුතු වුවත් කාර්යාංශයේ සේව්‍ය දායකය සියයට 12 ක් හා සේවක දායකය සියයට 10 ක් වීමෙන් සේව්‍ය දායකය සියය 3 ක් අඩුවෙන් ගෙවා තිබුණි. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය පිළිබඳ කිසිදු තොරතුරක් ගිණුම් සටහන්වල හෙළිදරව් කර ද නොතිබුණි.

(ආ) ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන් යෙදවීමේදී අනුරාධපුර, වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්ක 03 හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 32 ක් ආවරණය කිරීමට ක්ෂේත්‍ර සහායකයින් දෙදෙනෙකු පමණක් යොදවා තිබුණි.

(ඇ) බලපත්‍රලාභීන් විසින් නිරන්තරයෙන් ඛණිජ බලපත්‍රවල සඳහන් අනුමත ප්‍රමාණය ඉක්මවා කැණීම් කර තිබුණද, එම වැඩිපුර කැණීම් කර ඇති ප්‍රමාණ සඳහා රාජ්‍ය භාග අයකර ගැනීමටත් බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කිරීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමටත් සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ඈ) බලපත්‍ර නිකුත් කිරීමේදී ඊට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට පෙර අයදුම්පත සමඟ සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවත්, බලපත්‍රයක් මඟින් කැණීම් කරන ඛණිජ ප්‍රමාණය මත අයකළ යුතු රාජ්‍ය භාගය සඳහා අත්තිකාරම් මුදලකුත් අයකර තිබුණි. මේ හේතුවෙන් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි වූ අයදුම්පත්වලට අදාලව රු.255,984,868 ක් සමාලෝචිත වර්ෂය අවසානයට කාර්යාංශයේ සමුච්චිතව පැවතුණි. මේ තුළ ඇතුළත් වර්ෂ 3 ක් ඉක්මවූ අත්තිකාරම්වල එකතුව රු.66,166,080 ක් විය.

(ඉ) ඛණිජ ප්‍රවාහන බලපත්‍ර ලබාදීම කාර්යාංශයේ කාර්යයක් වුවද ඊට අමතරව වැලි කැණීම් ව්‍යාපෘති 4 ක් සඳහා බලපත්‍ර ලිවීම සඳහා කාර්යාංශයට අනුබද්ධ සමාගමක සේවකයින් 16 ක් යොදවා තිබූ අතර මෙම සේවකයන්ගේ වැටුප් අදාළ සමාගම විසින් ගෙවා තිබුණි.

(ඊ) වැලි ප්‍රවාහනය සඳහා නව බලපත්‍ර ලබා දීමේදී පැරණි බලපත්‍රය ආපසු භාරදිය යුතු වුවත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි අලෙවි ව්‍යාපෘතිවලින් ලොරි රථවලට නිකුත් කර තිබූ ප්‍රවාහන බලපත්‍ර ආපසු භාරනොදී දඩ මුදලක් පමණක් ගෙවා නව බලපත්‍ර නිකුත් කර තිබූ අවස්ථා 723 ක් විය. බලපත්‍ර ආපසු භාර නොදී රු.500 ක දඩ මුදලක් ගෙවීමෙන් නව බලපත්‍රයක් ලබගත හැකිවීම හේතුවෙන් එම ප්‍රවාහන බලපත්‍ර උපයෝගී කරගෙන පාලනයකින් තොරව වැලි ප්‍රවාහනයට ඉඩකඩ සලසා දී තිබුණි.

(උ) 2012 වර්ෂයේ සිට කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සතු ගොඩනැගිල්ල නීත්‍යානුකූලව පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 44 වගන්තිය ප්‍රකාරව ලබාගත යුතු ඛණිජ සඳහා වූ කැණීම්, ප්‍රවාහන, වෙළඳ හා අපනයන බලපත්‍ර ලබා නොගෙන සමාගම් 03 ක් විසින් 2014 -2017 දක්වා කාලය තුළ රත්‍රන් මිශ්‍රිත පස් බහාලුම් 51 ක් අපනයනය කර තිබුණි. රත්‍රන් කැණීම සඳහා අදාළ සමාගම් 3 විසින් ගෙවිය යුතු රාජ්‍යභාග රු.11,534,375 ක් ගෙවා නොතිබූ අතර එම රාජ්‍යභාග අයකර ගැනීම සඳහා කාර්යාංශය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) **දිරිදීමනා ගෙවීම**

2016 වර්ෂයට අදාලව සේවක දිරිදීමනා ලෙස රු.79,912,466 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 1996 අගෝස්තු 02 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් කාර්යසාධනය පදනම් කරගත් දිරිදීමනාවක් ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද එවැනි දිරිදීමනා ගෙවීමට අදාල ක්‍රමවේදයක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි.

(ii) දිරිදීමනා සඳහා අදාල කර නොගත යුතු ශුද්ධ ඉපයීම් රු.199,851,558 ක් දිරිදීමනා ගෙවීමේ දී පදනම් කරගෙන තිබු අතර ඒ මත රු.99,925,779 ක දිරිදීමනා ගණනය කර ගෙවා තිබුණි.

(iii) දිරිදීමනා ගණනය කිරීමේ පදනම ලෙස සේවකයන්ට වෙන් කර තිබු ලකුණු 1 න්, ලකුණු 0.75 ක් කාර්යසාධනය සඳහා වෙන්කර තිබුණද කාර්යසාධනය ඇගයීමකින් තොරව සියළු සේවකයන්ට 0.75 ක ලකුණු ලබාදී තිබුණි. ඉතිරි ලකුණු 0.25 ඉතිරිකරගත් වෛද්‍ය නිවාඩු ප්‍රමාණය අනුව සමානුපාතිකව ලබාදී තිබුණි. මේ අනුව කිසිඳු කාර්යසාධන ඇගයීමකින් තොරව ඉතිරි කරගත් නිවාඩු මත පමණක් පදනම්ව දිරිදීමනා ගෙවා තිබුණු බව අණාවරණය විය.

(iv) දිරිදීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලැබු මුදලින් සියයට 20 ක් එනම් රු.20,562,846 ක් හදිසි ආපදා අරමුදල නම් වූ භාණ්ඩාගාර අනුමැතිය නොලත් සුභසාධන අරමුදලකට බැර කර තිබුණි. ඉකුත් වර්ෂයේදී ද සියයට 5 ක ප්‍රතිශතයක් වූ රු.3,823,565 ක් මෙම අරමුදලට බැර කර තිබුණි.

(v) දිරිදීමනා ලෙස ශුද්ධ ඉපයීමෙන් සියයට 50 ක් වූ රු.101,475,313 ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණද, එම ශුද්ධ ඉපයීම තීරණය කිරීමේ දී ආදායමෙන් සියයට 15 ක් ලෙස පොදු කාර්ය වියදම් තීරණය කිරීමේ පදනම විගණනයට හෙළිදරව් නොකෙරුණි.

(vi) සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ලෙස රු.මිලියන 110 ක් ප්‍රතිපාදනය කර තිබුණද ඒ සඳහා ඇස්තමේන්තු ගත ලාභයක් පදනම් කර ගෙන නොතිබුණි.

(vii) භාණ්ඩාගාර අනුමැතියක් රහිතව කාර්යාංශයට අනුබද්ධිත සමාගමකින් කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කළ සේවකයන් 114 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් 2017 වර්ෂයේදී රු.5,449,500 ක දිරිදීමනා ගෙවා තිබුණි.

**(ඇ) යාන්ඔය ජලාශ යෝජනා ක්‍රමය**

(i) යාන්ඔය ජලාශ ව්‍යාපෘති භූමියෙන් මතු වූ වැලි නිධිය ඉවත් කළ යුතු ආකාරය පිළිබඳ ක්‍රමවත් සැලැස්මක් මත ක්‍රියාකර තරඟකාරී හා විවෘත ක්‍රියාමාර්ගයක් තුළින් වැලි ඉවත් කිරීම සඳහා ගැණුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) වැලි කැණීම්කරුවන් සඳහා බලපත්‍ර ලබා දීමේදී එක් එක් කැණීම් ප්‍රදේශ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සහ 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 30 වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තු අනුමැතිය රහිතව කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර 126 ක් නිකුත් කර තිබුණි.

(iii) කැණීම් බලපත්‍රවල සඳහන් කොන්දේසි ගණනාවක් කැණීම්කරුවන් විසින් කඩකර තිබුණද ඒ පිළිබඳව පසු විපරම් කිරීමට හෝ 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 37(අ) වගන්තිය ප්‍රකාරව පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 61 වගන්තිය ප්‍රකාරව පරිසරය පුනරුත්ථාපනය කිරීමේ වගකීම පැහැර හැර ඇති කැණීම්කරුවන්ට එරෙහිව පනත ප්‍රකාරව කටයුතු කිරීමට හා ඊට අදාල කාර්යයන් නිසි අධීක්ෂණයකට ලක්කර පරිසරය පුනරුත්ථාපනය කරවීමට පියවර ගෙන නොතිබුණි.

(v) යාන්ඔය ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කර තිබූ පස් කියුබ් 1,338,727 ක් සඳහා අයකරගත යුතු රු.26,774,540 ක රාජ්‍යභාග අදාළ ඉදිකිරීම් සමාගමෙන් අයකරගෙන නොතිබුණි.

(ඈ) වැලි කියුබ් 01 ක් සඳහා පැවති නිශ්චය කරන ලද රු.4,000 ක වෙළඳ මිල, අංක 129/12/2016 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් 2017 ජනවාරි 01 සිට රු.8,000 දක්වා සියයට 100 කින් වැඩිකර තිබුණි. මෙම වැඩි කිරීම සඳහා පදනම් කරගත් වෙළඳපල සමීක්ෂණ තොරතුරු, ඉල්ලීම් හෝ අනුමැතීන් කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් නොවූ අතර වැලි සඳහා නිශ්චය කල වෙළඳ මිල ලෙස සැලකිය යුතු කැණීම් ස්ථානයේදී අලෙවි වන මිල රු.3,500 ත් රු.4,450 ත් අතර පැවතියද අදාළ මිල ලෙස රු.8,000 ක් නියම කිරීම මතභේදයට තුඩුදී තිබුණි.

(ඉ) කාර්යාංශයට අනුබද්ධ සමාගමක් විසින් ක්‍රියාත්මක කරන වැලි කැණීම් ව්‍යාපෘති 4 ක ප්‍රවාහන බලපත්‍ර අත්සන් කිරීම අදාළ සමාගම හරහා කොන්ත්‍රාත් පදනමට සේවයේ යොදවන ලද සේවකයන්ට පවරා තිබුණි.

**4.4 දෘශ්‍ය අක්‍රමිකතා**

--------------------

2014 වර්ෂයේ විෂයභාර අමාත්‍යවරයාගේ දැනුම්දීම මත කාර්යාංශයේ කාර්යභාරය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 11 ක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබූ අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කමිටුව නිර්දේශ කර තිබූ ආයතනයට රු.1,500,000 ක අත්තිකාරම් මුදලක් ගෙවීමට 2014 දෙසැම්බර් 30 දින සභාපතිවරයා අනුමත කර තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 20 දින කාර්යාංශය විසින් සභාපතිවරයා වෙත මුදලින් අත්තිකාරම් ලබාදී තිබුණි. මුදල් වැය කළ ආකාරය හෝ ඉටුකළ කාර්යය පිළිබඳ කිසිදු තොරතුරක් කාර්යාංශය සතුව නොතිබුණු අතර 2018 ජූනි 30 දක්වා අත්තිකාරම් පියවා නොතිබුණි

**4.5 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

----------------------------------------------------------------------

2014 වර්ෂයේ කාර්යාංශය විසින් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඉඩමක රු.4,040,144 ක් වැයකර ප්‍රාදේශීය කාර්යාලයක් ඉදිකර තිබූ අතර එම මුදල කාර්යාංශයට ලබා දීමනික් තොරව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අදාල ගොඩනැගිල්ල ආපසු ලබාගෙන තිබුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් කාර්යාංශයේ සම්පත්**

------------------------------------------------------------

2003 ජූනි 03 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව කාර්යාංශයේ භූ විද්‍යාඥයින් දෙදෙනෙකු 2016 ඔක්තෝබර් 17 දින සිට විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

කාර්යාංශයේ අනුමත කාර්යමණ්ඩලය 445 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 306 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 139 ක් විය. ඒ පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුරප්පාඩුව පැවති ක්ෂේත්‍ර සහකාර තනතුරු 17 ක්, සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ(මුදල්) තනතුරු 03 ක්, ගිණුම් නිලධාරී තනතුරු 02 ක් හා ප්‍රවාහන නිලධාරී තනතුර සඳහා සමාලෝචිත වර්ෂයේ බඳවාගැනීම් සිදුකර නොතිබුණි.

(ආ) කාර්යාංශයට අනුබද්ධ සමාගමක් හරහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 73 ක් කාර්යාංශයට බඳවාගෙන තනතුරට අදාළ සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කරගැනීමකින් තොරව හා මාසිකව ඉටුකළ කාර්යභාරය තහවුරු කර ගැනීමකින් තොරව මාසිකව ගාස්තු හා දීමනා ලෙස රු.2,847,451 ක් ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත් සේවකයන්ගෙන් 37 ක් කළමනාකරණ සහකාර තනතුරු සඳහා වූ අතිරික්ත බඳවා ගැනීම් විය.

(ඇ) කාර්යාංශයේ ලේඛකාධිකාරී/සහකාර ලේඛකාධිකාරී තනතුරු 04 ක පුරප්පාඩු පැවතියද, සහකාර ලේඛකාධිකාරීවරුන් ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 17ක්ද, කාර්යාංශයට අනුබද්ධිත සමාගම හරහා එක් සහකාර ලේඛකාධිකාරීවරයෙකු ද බඳවාගෙන තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 100 ක් සේවයේ යොදවා තිබියදී උපාධිධාරී පුහුණු වන්නන් 168 ක් ද බඳවාගෙන තිබුණි. 2000 ජූලි 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2000 ප්‍රකාරව මෙකී පුහුණුවන්නන් සඳහා වගකිව යුතු රාජකාරියක් නොපැවරිය යුතු වුවද ප්‍රාදේශීය කාර්යාලවල හා ප්‍රධාන කාර්යාලයේ කාර්යාලීය රාජකාරී කටයුතුවල යොදවා තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 315 ප්‍රකාරව වත්කම් භාරකාරිත්වයක් ඇති ගබඩා නිලධාරී තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව කොන්ත්‍රාත් පදනම මත 2016 සිට 2018 ජූනි දක්වා සේවයේ යොදවා තිබුණි.

(ඊ) බඳවාගැනීමේ පටිපාටි අනුමත කර නොගෙන හු විද්‍යාඥ තනතුරු 04 ක් සඳහා බඳවාගෙන තිබුණි.

(උ) අනුමත කාරයමණ්ඩලය තුළ නොවූ තනතුරක් මූල්‍ය උපදේශක තනතුර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පූර්ව අනුමැතිය හා භාණ්ඩාගාර අනුමැතිය රහිතව මූල්‍ය උපදේශකවරයෙකු මාස 06 ක කාලයක් සඳහා බඳවාගෙන තිබුණි. උපදේශකවරයාට කාර්යය පැවරුමක් ලබාදී නොතිබුණ අතර ඉටුකල රාජකාරී පිළිබඳ වාර්තාද නොවුණි. අධ්‍යක්ෂ මුදල් තනතුරේ රාජකාරී ඉටුකිරීමට ස්ථිර නිලධාරියෙකු පත්කර තිබියදී පත්කර තිබූ මෙම මූල්‍ය උපදේශකවරයාට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රහිතව මාසයකට රු.63,000 බැගින් රු.378,000 ක් ගෙවා තිබුණි.

(ඌ) අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර

---

(i) 2017 අගෝස්තු 14 දින අනුමත කර තිබූ අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුරට අදාළ අනුමත බඳවාගැනීම් පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳව වූ කොන්දේසි විස්තරාත්මකව හා නිශ්චිතව දක්වා නොතිබුණි.

(ii) තනතුරට බඳවා ගැනීම සඳහා පළකල පුවත්පත් දැන්වීම්වල අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද දැක්වීමේදී අනුමත බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් වෙනස්කර දක්වා තිබුණි.

(iii) බඳවාගැනීමේ පරිපාටිය අනුව සම්මුඛ පරීක්ෂණයේදී ලබාදිය යුතු ලකුණු, අතිරේක සුදුසුකම් සහ අතිරේක පලපුරුද්ද සඳහා ලකුණු 30 ක් බැගින් ද වෙනත් ජයග්‍රහණ සඳහා ලකුණු 15 ක් හා සම්මුඛ පරීක්ෂණයේදී කාර්යසාධනය සඳහා ලකුණු 25 ක් වශයෙන් වෙන්කර තිබුණද එක් එක් බාණ්ඩය යටතේ වූ විවිධ ක්ෂේත්‍රයන් සඳහා සලකා බලන නිර්නායක හා ලකුණු වෙන්කර ඇති ආකාරය, කලින් තීරණය කර සම්මුඛ පරීක්ෂණ ලකුණු ලබාදීමේ පරිපාටියක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iv) බඳවාගැනීමේ පරිපාටිය අනුව අධ්‍යක්ෂ(මූල්‍ය) තනතුරට අවුරුදු 13 ක සේවා පලපුරුද්දක් තිබිය යුතු වුවත් බඳවාගෙන තිබූ අයදුම්කරු අවුරුදු 05 ක සේවා පළපුරුද්ද පමණක් ලබා තිබුණි.

**4.8 වාහන උපයෝජනය**

කාර්යාංශය සතුව වාහන 48 ක් පැවතියද අනුයුක්ත රියදුරු සංඛ්‍යාව 33 ක් වීම හේතුවෙන් වාහන ඌන උපයෝජිතව පැවතුණි. වාහන 23 කට රියදුරන් අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් ඒවායේ වගකීම කිසිම රියදුරෙකුට භාරදී නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 31 දිනදීය.

## 6.2 අභ්‍යන්තර විගණනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශයට අනුමත කර තිබූ 4 දෙනෙකුගෙන් යුත් ස්ථිර සහායක විගණන කාර්ය මණ්ඩලය පත් කර නොතිබූ අතර සාමාන්‍ය ලිපිකරුවන් 4 ක් පමණක් පත්කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 133(2) ප්‍රකාර කාර්යාංශයේ සියළු අංශ ආවරණය වන පරිදි විධිමත් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර භූ විද්‍යා අංශයේ ඒකක 02 ක් හා මානව සම්පත් කළමනාකරණ අංශයේ ක්‍රියාකාරකම් 11 ක් විගණන සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර ඒවා විගණනයට ලක්කර නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ඉටුකළ යුතුව තිබූ භූ විද්‍යා අංශයට අදාල පරීක්ෂණ කාර්යයන් 11 ක් ඉටුකර නොතිබුණි.

(ඈ ) අභ්‍යන්තර විගණනය අනාවරණය කිරීම් සඳහා ඒ ඒ අංශ විසින් ගෙන තිබූ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

--------------------------------------------

### 6.3.1 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශය සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මට, උපදේශක සේවා හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ ප්‍රසම්පාදනයන් ඇතුළත් කර නොතිබුණි. පිළියෙල කර තිබූ ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ද ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබූ අතර, සැලැස්ම යාවත්කාලීන කිරීමටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) වර්ෂය තුළ ආරම්භ කළ යුතු රු.385,000,000 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 3 ක් වර්ෂය තුල ආරම්භ කර නොතිබුණු අතර වර්ෂය තුළ  අවසන් කල යුතු රු.182,813,000 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 6 ක් අවසන් කර නොතිබුණි.

(ඇ) ආයතන ප්‍රතියාන්ත්‍රණය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධති අධ්‍යනයක් සිදුකිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට වර්ෂ හයකට පෙර ගෙවා තිබුණු රු.1,505,000 ක් මුල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණද අදාල පද්ධතිය ස්ථාපිත කිරීම 2018 ජූනි දක්වා සිදුකර නොතිබුණි. මේ පිළිබඳව පසුවිපරම් කටයුතුද සිදුකර නොතිබුණි.

## 6.4 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 27 සිට සියයට 218 දක්වා හා අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 12 සිට සියයට 1203 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**6.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

-------------------------------

2003 ජූනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පරිදි සිය වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් කාර්යාංශය විසින් 2015 සහ 2016 වර්ෂවල වාර්ෂික වාර්තා 2018 ජුනි මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6.6 නොවිසඳී ඇති විගණන ඡේද**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ නිළධාරීන් 04 ක් අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී පසුව ගිවිසුම් ප්‍රකාරව අනිවාර්ය සේවාකාලය සම්පූර්ණ නොකර සේවයෙන් ඉවත්වී තිබීම හේතුවෙන් අය කර ගත යුතු දණ්ඩන මුදල් සහ අනෙකුත් වියදම් රු.2,459,663 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂයේදී ගෙන නොතිබුණි.

(ආ) හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු විසින් ලබාගෙන ඇති බව සඳහන් රු. 597,231 ක් වටිනා උපකරණ ගබඩා ලේඛණවල සාවද්‍ය ආකාරයෙන් සටහන් වූවක් ලෙස විගණනයට දන්වා තිබුණද අදාළ වරද සමාලෝචිත වර්ෂයේද නිවැරදි කර නොතිබුණි.

(ඇ) විදේශ සංචාරයක් සඳහා සහභාගී වූ කාර්යාංශයේ නිළධාරීන් 9 දෙනෙකු වෙත 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 6 (iii) වගන්තියට පටහැනිව නියමිත සංයුක්ත දීමනාව ඉක්මවා රු.469,300 ක මුදලක් 2015 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේද මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඛණිජ වැලි අපනයනයේදී එම වැලිවල නැව තෙක් නොමිලේ (එෆ්ඕබී) වටිනාකම මත සියයට 7 ක රාජ්‍යභාග අයකර ගත යුතු වූ අතර පුද්ගලික සමාගමක් විසින් ඛණිජවැලි අපනයනයේදී අදාල නැව තෙක් නොමිලේ වටිනාකම සාවද්‍ය ලෙස ගණනය කිරීම හේතුවෙන් රාජ්‍යභාග අඩුවෙන් ගෙවා තිබුණි. මේ පිළිබඳ ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් හෙළිදරව් කර තිබුණද සොයා බලා නිවැරදි වටිනාකම් අයකර ගැනීමට පියවරගෙන නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ සේවාදායකයන් වෙනුවෙන් මිලදීගෙන ඔවුන් විසින් ප්‍රතිපූරණය කරන ලද රු.964,300 ක් වටිනා වත්කම් කාර්යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

**6.7 පරිසර හා සමාජ වගකීම් ඉටු කිරීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඛණිජ කැණීම් බලපත්‍ර ලබාදීමේදී බලපත්‍රයේ කැණීම් භූමි ප්‍රතිසංස්කරණය සඳහා කොන්දේසි ඇතුලත් කර තිබුණු අතර කැණීම් භූමි ප්‍රතිසංස්කරණය සඳහා බලපත්‍රලාභියා පෙළඹවීමට බැංකු ඇපකරයක් ද කාර්යාංශය විසින් ලබාගෙන තිබුණි. එහෙත්, බලපත්‍රලාභීන් බලපත්‍ර කොන්දේසි කඩකර තිබූ අතර බැංකු ඇපකරය ලබාගෙන හෝ භූමි ප්‍රතිසංස්කරණයට අවශ්‍ය පියවරද ගෙන නොතිබුණි. මෙහිදී කොන්දේසි කඩකල බලපත්‍රලාභීන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට හා අසාදු ලේඛණයට ඇතුලත් කර බලපත්‍ර නැවත ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් සිදුකරනු ලබන ඛණිජ ද්‍රව්‍ය ඉවත් කිරීම් හේතුවෙන් උග්‍ර පාරිසරික හා සමාජීය ගැටලු පැන නැගී ඇති බව නිරීක්ෂණය වුවද එවැනි ඛනිජ කැණීම් වළකාලීම සඳහා කාර්යාංශය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ඇතැම් පොත්පත් පවත්වා නොගැනීම<br>(ii) ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති හා ප්‍රතිපත්ති අනුගමනය නොකිරීම<br>(iii) ජ' නල් සටහන් අනුමත නොකිරීම |
| (ආ) රසායනාගාර වාර්තා නිකුත් කිරීම | වාර්තා නිකුත් කිරීමේ ක්‍රමවේද නිශ්චිතව හා ලිඛිතව පවත්වා ගැනීම හා අදාල අංශ දැනුවත් නොකිරීම |
| (ඇ) මෙහෙයුම් පාලනය | (i) ඛණිජ ප්‍රවාහනය සම්බන්ධ තීරණ ගැනීම අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු නොකිරීම<br>(ii) තනතුරු සඳහා ලැබෙන ආදායමක් පිළිබඳ ලේඛණයක් නඩත්තු නොකිරීම. |
| (ඈ) සුළු මුදල් අග්‍රිම භාවිතය | ප්‍රාදේශීය කාර්යාල සුළු මුදල් අග්‍රිම භාවිතා කර මාසික බිල්පත් පියවා තිබීම. |
| (ඉ) සේවක කළමනාකරණය | (i) තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් පිළිබඳ සටහන් කිරීමට ලේඛණයක් අධ්‍යක්ෂ ජනරාල් විසින් නඩත්තු නොකිරීම.<br>(ii) අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර සඳහා බඳවාගැනීමේදී අයදුම්කරුවන් වෙත ලකුණු ලබාදීමේ විනිවිදභාවයක් නොතිබීම |
| (ඊ) වාහන පාලනය | (i) මුදල් රෙගුලාසි 1645 හා 1646 ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබීම<br>(ii) දෛනික ධාවන සටහන් හා මාසික ධාවන සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.<br>(iii) අම්පාර හා කළුතර ප්‍රාදේශීය කාර්යාලවල රාජකාරී සඳහා ලබාදී තිබූ වාහන 2 හි ඇතැම් ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබීම.<br>(iv) ධාවන සටහන් අනුව අම්පාර හා කළුතර ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත වාහනයේ අදාල ගමන් රාජකාරී ගමන් බවට සහතික නොවීම.<br>(V) වාහන අළුත්වැඩියා කර ගැනීම සඳහා ගරාජ ලියාපදිංචි කර නොතිබීම |